සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# "නැණ සිළු 2024"

## පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන විභාගය

## කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

**කට්ටල අංක - 8** I පත්‍රය

විභාග අංකය : ..........................................................

කාලය - පැය 1 යි

විභාගයට පෙනී සිටීමට ඔබට උපදෙස් :

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කිරීම. | |
| | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් ප්‍රධානය කළ ලකුණ සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය. | |
| | V/II/S/CH |

සම්පාදනය :- එම්.එල්.අරුණ ප්‍රියංකර - කු/සියඹලංගමුව ප්‍රාථමික විද්‍යාලය - 076 3 100 710

1. පහත මුල් රූපයට සමාන රූපය තෝරන්න.




1 

2 


3 


2. පහත රූපය  නිරීක්ෂණය කරන්න. ඒ පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.





1. පෙර පාසල් දරුවෝ හයදෙනෙක් සිටිති.
2. පිරිමි දරුවෝ දෙදෙනෙක් සහ ගැහැනු දරුවෝ තිදෙනෙක් සිටිති.
3. පෙර පාසල් දරුවන් පස්දෙනෙක් සිටිති.

3. පහත සටහනෙහි හිස්තැනට ගැළපෙන පිළිතුර කුමක්ද?



1. 

2. 

3. 

4. පහත කවියෙහි හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත්  පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| ඉර ................ නැගෙන හිරිනි | 1.උදාව , බටහිරේ ය |
| එම දිසාව හැරෙනු සෙදින | 2. බැසීම , බටහිරේ ය |
| පිට දිසාව එවිට නිතිනි | 3. උදාව , නැගෙනහිර ය |
| ............................ දනිව් සොඳිනි | |

5. හිරුණිගේ තාත්තාගේ මල්ලි කවිජ ය. ඔහුගේ පුතා අදීෂ වේ. නිෂ්මිගේ මවගේ මල්ලී ද අදීෂ  ම වේ. ඒ අනුව නිෂ්මිට හිරුණිගේ ඇති නෑකම කුමක් ද?

1. මිණිබිරිය    2. නැන්දා    3. දුව


6. පොතක මිල පෑනක මිල මෙන් හතරගුණයකි. පෑන් 8ක් හා පොත් 2ක් මිලට ගැනිමට රු:200ක් වැය වේ නම්,

1. පෑනක් රු 25.00කි　　2 පොතක් රු 50.00 කි　　3 පොතක් රු 25.00කි


7. ලී පටි 2ක් සම්බන්ධ කිරීමට ඇණ 3ක් අවශ්‍ය වේ. එකපෙළට ලී පටි 5ක් සම්බන්ධ කිරීමට ඇණ කීයක් අවශ්‍ය වේ ද?


1. 15 කි.　　2. 5 කි　　3. 12 කි

- **පහත හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු තෝරන්න**

8. 


1. 7　　2. 10　　3. 14

9. 


1 

2 

3 


10. පහත ඇති කවිය කියවා ගැළපෙන පිළිතුර තෝරන්න

ගොන් බැන්දෙත් නෑ　　1. තවලම
අසු බැන්දෙත් නෑ　　2. දුම්රිය
දුං දාගෙන එකට බැඳි　　3. බස් රථය
කරත්තෙ යනවා....

11. මට සඳෙළු හමුවුයේ බදාදා ය. මිනුක ඊට පසු දින හමුවිය. ඔහු හමු වූ දිනට දින තුනකට පසු මතීෂ හමු විය. මතිෂ හමුවීමට පෙර දින දනුක හමු විය. ඒ අනුව දනුක මට මුණගැසුණු දිනය වන්නේ,

1. සඳුදා　　2. ඉරිදා　　3. සෙනසුරාදා

12. රවුම තුළ ඇති සංඛ්‍යා සියල්ල වෙන වෙනම දෙකෙන් බෙදූ විට ලැබෙන ඉලක්කම් හතර යොදාගෙන සෑදිය හැකි කුඩාම සංඛ්‍යාව




1. 9541
2. 2459
3. 1459

13. මුහුණතෙහි ඉලක්කම් සටහන් වු ඔරලෝසු මුහුණතක් බිම වැටී කොටස් තුනකට වෙන් වී ගියේ ය.එම කොටස් තුනේ ම වු ඉලක්කම් එකතු එකිනෙකට සමාන විය. එම එක් කොටසක තිබිය හැකි ඉලක්කම් වන්නේ,

1. 11 , 12 , 1 , 2 2. 6 , 7 , 8 , 9 3. 1 , 2 , 3 , 4

14. එක් පියෙක් තම පුතාට රුː 150ක් ද තවත් පියෙක් තම පුතාට රු. 100 ද දුන්නේ ය. නමුත් පුතුන් දෙදෙනා සතු මුදල් එකතුව වූයේ රු. 150 කි. මෙම ප්‍රකාශය,

1. සත්‍ය විය හැකිය. 2. අසත්‍ය විය හැකිය. 3. කිසිවක් කිව නොහැකිය.


15. ගුවන් යානයක් A නගරයේ සිට B නගරයට යාමට පැය 1 මිනිත්තු 20 ක් ගත කරයි. ආපසු ඒම සඳහා මිනිත්තු 80 ක කාලයක් ගත කරයි. මෙම ප්‍රකාශය,

1. සත්‍ය වේ 2. අසත්‍ය වේ 3. නිශ්චිතව කිව නොහැක

16. වැටක සමාන පරතරයකින් කණු 10 ක් සිටුවා ඇත. එම වැටේ කම්බි පොටවල් 3 ක් ගැසීම සඳහා 81m ක් දිග කම්බි අවශ්‍ය වේ. වැටේ කණු 2ක් අතර පරතරය වන්නේ,

1. 10 m 2. 9 m 3. 3 m

17. හිස්තැන් සඳහා ආ යුතු සංඛ්‍යා මොනවාද?





1. 64, 63 2. 63, 62 3. 62, 61

18. පහත සඳහන් කවියේ අදහස වන්නේ,

ඉරිඟු කරල් කන ගිරවුන් රෑනයි
සිහින් කුරක්කන් අවුලන රෑනයි
බියවැද දුවයන හා පැටි බානයි
හේනක සිරිබර මේ ආකාරයි

1. ගිරවුන් පිළිබඳව ය. 2. හා පැටවුන් පිළිබඳව ය. 3. හේනක අලංකාරය පිළිබඳව ය.

**පහත රූප සටහන බලන්න.**




මෙහි දක්වා ඇත්තේ පන්තියක දරුවන් පලතුරු වර්ග දෙකක් ආහාරයට ගැනීමට දක්වා ඇති කැමැත්තයි.

පේර ආහාරයට ගැනීමට 18 දෙනෙකු කැමති අතර අඹ ආහාරයට ගැනිමට 16 දෙනෙකු කැමති ය.


19. පන්තියේ දරුවන් 40 කි. එසේ නම් A ස්ථානයට ගැළපෙන සංඛ්‍යාව වන්නේ,

1. 16 2. 10 3. 26

20. අඹ පමණක් ආහාරයට ගැනීමට කැමති මුළු සිසුන් ගණන කීයද?

1. 24 2. 12 3. 22


21.




C භාජනය පිරවීමට B භාජනයෙන් වාර 2 ක් ජලය දැමිය යුතුය. B භාජනය පිරවීමට A භාජනයෙන් වාර 2ක් ජලය දැමිය යුතුය. A භාජනයට අල්ලන ජලය ප්‍රමාණය විය හැක්කේ,

1. 200 ml 2. 250 ml 3. 500 ml

- පහත දැක්වෙන්නේ සැලැස්ම නිල් පාටින්ද, ඉදිරි පෙනුම රතු පාටින් සහ පැති පෙනුම කහ පාටින් පාට කළ ඝනකයකි. එහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත් ද මේ ආකාරයට ම පාට කර ඇත. මෙහි දක්වා ඇති ඉරි දිගේ ඝනකය කුඩා ඝනකවලට කපා වෙන් කරන ලදී. ඒ අනුව,



22. නිල්,රතු සහ කහ පාට තුනක් සහිත කුඩා ඝනක ගණන

1. 8 2. 9 3. 27

23. මුහුණත් දෙකක් පමණක් නිල් සහ රතු පාට වූ කුඩා ඝනක ගණන කීයද?

1. 12 2. 6 3. 8

24. එක්තරා මෝටර් රථයක් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 10 ක් ධාවනය කළ හැකි ය.පෙට්‍රල් ලීටරයක මිල රු. 150.00 ක් නම් කිලෝමීටර 50ක් ධාවනය කිරීමට අවශ්‍ය පෙට්‍රල් සඳහා යන වියදම කොපමණ ද?

1 රු. 1500.00 2 රු. 750.00 3 රු. 150.00

25. මා ළඟ ටොෆි යම් ප්‍රමාණයක් ඇත. එය ළමයින් දෙදෙනෙකු අතර බෙදා දුන් විට ද,හතර දෙනෙකු අතර බෙදා දුන් විට ද එක බැගින් ඉතිරි වේ. මා ළඟ ඇති අවම ටොෆි ගණන කීයද?

1. 40 2. 33 3. 30

26. පාසලක ප්‍රධාන රැස්වීම සෑම සතියක ම සඳුදා දිනවල පැවැත්වේ. ඔක්තෝබර් මාසයේ අවසාන රැස්වීම එම මාසය තිස්වන දින පැවැත්වුණි. සැප්තැම්බර් මාසයේ අවසාන රැස්වීම පැවැත්වූ දිනය කුමක් ද?

1.23 2.25 3.24

27. පහත දැක්වෙන ළමයින්ගේ වයස අනුව අවරෝහණ පිළිවෙළට නම් පෙළ ගැන්වූ විට තුන්වෙනියා වන්නේ,

| නම | උපන්දිනය |
|---|---|
| චතුක | 2019.08.02 |
| මිනුක | 2020.08.07 |
| රිසෝන් | 2019.08.30 |
| ප්‍රමෝද් | 2018.08.01 |

1. ප්‍රමෝද්
2. චතුක
3. රිසෝන්


පහත සිද්ධි නිවැරදි අනුපිළිවෙළින් ලියා ඇති පිළිතුර තෝරන්න.

1. සවන් දීම ⟶ කියවීම ⟶ කතා කිරීම

2. කියවීම ⟶ සවන් දීම ⟶ කතා කිරීම

3. සවන් දීම ⟶ කතා කිරීම ⟶ කියවීම

28. මෙම රූපයට සම්බන්ධ ව නිවැරදි ප්‍රකාශය තෝරන්න,




1. C කොටස A ට ද අයත් ය.
2. D කොටස A හා B දෙකටම අයත් ය.
3. D කොටස Aට පමණක් අයත් ය.

29. ලොරි රථයක් පැයට කිලෝමීටර 50ක වේගයෙන් පැය 2ක් ගමන් කළේ ය. එය තවත් කිලෝමීටර 125 ක දුරක් ගමන් කළ යුතුව ඇත. ලොරි රථය ගමන් කළ යුතු මුළු දුර කොපමණ ද?

1. 175 km　　2. 225 km　　3. 100 km

- ඇතුළ නොපෙනෙන පෙට්ටියක එකම හැඩයේ කළු සහ සුදු සපත්තු කුට්ටම් පිළිවෙළින් 3ක් සහ 2 ක් ඇත. ඒ දෙස නොබලා,


30. නොවැරදීම එකම වර්ගයේ සපත්තු කුට්ටමක් ලබාගැනීමට ඉවතට ගත යුතු අවම සපත්තු ගණන කීයද?

1. 6　　2. 7　　3. 5

31. නොවැරදීම සුදු සපත්තු කුට්ටමක් ලබා ගැනීමට ගත යුතු අවම සපත්තු ගණන කීයද?

1. 9　　2. 7　　3. 2

- පහත දැක්වෙන ඝනකයේ අඳුරු කර ඇති කුඩා ගණක, විශාල ඝනකය තුළින් එහා මෙහා පෙනෙන පරිදි ඉවත් කර ඇත.



32. මෙසේ ඉවත් කර ඇති කුඩා ඝනක ගණන කීයද?

1. 6　　2. 5　　3. 10

33. මෙම ඝනකයේ ඉතිරි කුඩා ඝනක ගණන කීයද?

1. 54　　2. 64　　3. 61

34. දිග සහ පළල මීටර 3 බැගින් වන සමචතුරස්‍ර හැඩයේ බිමක දිග සහ පළල සෙන්ටිමීටර 50 බැගින් වන ටයිල් කැට ඇතිරීමට සිදුව ඇත.ඒ සඳහා අවශ්‍යය ටයිල් කැට ගණන කීයද?

1. 9　　2. 150　　3. 36

35. පහත සංඛ්‍යා පේළියේ දී ඇති පිළිතුර ලැබීමට හිස් තැන්වලට යෙදිය යුතු ගණිත කර්ම පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

5 [ ...... ] 5 [ ..... ] 5 = 30

1. +, x　　2. x , +　　3. x , x

- මාලිකා පෙරවරු 6.00 සිට පෙරවරු 6.45 තෙක්ද චාමිකා පෙරවරු 5.30 සිට පෙරවරු 6.30 තෙක්ද, ශාමිකා පෙරවරු 5.45 සිට පෙරවරු 7.30 තෙක්ද පාඩම් කළේ ය.

36. මොවුන් තිදෙනා ම පාඩම් කළ මුළු කාලය කොපමණ ද?

1. පැය තුනයි.　　2. පැය තුනයි මිනිත්තු තිහයි　　3. පැය හතරයි

37. එකවර දෙදෙනෙකු පමණක් පාඩම් කළ කාලයන්ගේ එකතුව කීයද?

1. මිනිත්තු තිහයි 2. මිනිත්තු 45යි 3. මිනිත්තු පහළොවයි

38. හිස්තැන්වලට ගැළපෙන වචන අයත් පිළිතුර තෝරන්න.

ඒ මනරම් ……… ගලා එන සිසිල් ……….. මල් සුවඳ පැතිර ගියේ ය.

1. දහවලේ, සිසිල් 2. රාත්‍රියේ, සුළඟින් 3. රාත්‍රියේ, සුවඳින්

40. විදේශගතව සිටි තාත්තා දින 100 ක නිවාඩුවකට ඊයේ නිවසට පැමිණියේ ය.මගේ උපන් දිනය 2024 ජනවාරි 15 දිනට යෙදී ඇත. මගේ උපන් දිනය සමරන්නේ හෙට දිනයේ දී නම් තාත්තා නැවත විදේශගත විය යුත්තේ කවදා ද?

1 අප්‍රේල් 19 2 අප්‍රේල් 18 3 අප්‍රේල් 21

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# "නැණ සිළු 2024"

## පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන විභාගය

## කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

**කට්ටල අංක - 8** II පත්‍රය

විභාග අංකය : ........................................................

කාලය - පැය 1 යි මිනිත්තු 15යි

විභාගයට පෙනී සිටීමට ඔබට උපදෙස් :

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ඉරි ඇඳීමට ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලිවීමට නියමිත ප්‍රශ්නවලට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත පැහැදිලි හා නිවැරදි අකුරින් ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කිරීම. | <br>V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් ප්‍රධානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය. | <br>V/II/S/CH |

සම්පාදනය :- එම්.එල්.අරුණ ප්‍රියංකර - කු/සියඹලංගමුව ප්‍රාථමික විද්‍යාලය - 076 3 100 710

{දෙවැනි පිටුව බලන්න}

1. **පහත දැක්වෙන ජේදය කියවන්න.**

වර්ෂා කාලයේ ගෙය අසල අගලේ හෝ පොකුණේ වතුර පිරේ. හවස් වන විට අගලෙන් හෝ පොකුණෙන් හෝ නැවතීමක් නැතිව කෙරෙන ඝෝෂණයක් ඇසේ. එය කනට ප්‍රිය ඝෝෂණයක් නොවේ: මැඩියන් රාශියක් කරන ඝෝෂණය යි. වතුර පිරුණ හැටියේ අගලක මැඩියන් රාශියක් ඇතිවූයේ කෙසේ ද? වල්ගය සහිත ඉස්ගෙඩියා ලොකු වීමෙන් මැඩියා වන බව කවුරුත් පාහේ දනිති. මැඩියකුගේ බිත්තරවලින් ඉස්ගෙඩියෝ සෑදෙති. ඒ ඉස්ගෙඩියෝ වැඩී මැඩියෝ වෙති. මෙය දවසකින් දෙකකින් සිදු නො වේ. අගලේ හදිසියේ පිරෙන මැඩියෝ පිටතින් පැමිණෙති.

- **ජේදය ඇසුරින් පමණක් පිළිතුරු සපයන්න.**

I. වර්ෂා කාලයේ වතුර පිරෙන්නේ කොහේ ද? ....................................................................................

II. හවස් වන විට අගලෙන් හෝ පොකුණෙන් ඇසෙන්නේ කුමක්ද?.........................................................
.......................................................................................................................................

III. ප්‍රාණවාචී අනුක්ත නාම පදයක් ලියන්න.......................................................................................

IV. 'රහිත' යන්නට විරුද්ධාර්ථ පදයක් ජේදයෙන් සොයා ලියන්න. ....................................................

V. ''වර්ධනය වී''යන පදය ජේදයේ යෙදී ඇත්තේ කෙසේ ද? ..............................................................

VI. මූර්ධජ අක්ෂර එකක් පමණක් යෙදුණු වචනයක් ජේදයෙන් සොයා ලියන්න. ..........................................

2. පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි උක්ත අඛ්‍යාත සම්බන්ධය **නිවැරදි නම් √ ලකුණද වැරදිනම් X ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ** යොදන්න.

I. හාවා එක පිම්මෙන් දියපහර හරහා පැන්නා ය. (............)

II. හේන් ගොවියෝ වැට බැඳීම ආරම්භ කළහ. (............)

III. සිසිල් සුළඟින් මල් සුවඳ පැතිර යති. (............)

IV. කමලා උදෑසන ම පාසල් ගියා ය. (............)

V. අපි දිනපතා දත් මදිමු, (............)

3. **අතීතකාල බහුවචන ක්‍රියාපදය** තෝරා හිස්තැන මත **ලියන්න**. **.....................................**

I. **යති** II. ගියහ III. ගියාය.

4. එක් එක් ප්‍රශ්නයෙහි **නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

I. ගොවිපල, ගොවිපොල, ගොවිපොළ

II. කැලණි, කැළණි, කැළනි

III. උච්චාරණය, උච්චාරනය, උච්ජාරණය

5. පහත සඳහන් වාක්‍යය **වර්තමාන කාල ඒකවචනයට** හරවා **නැවත ලියන්න**

ඔවුහු තරගයට නිර්මාණ ඉදිරිපත් කළෝ ය.

.......................................................................................................................................

6. පහත සඳහන් එක් එක් වචනයට **ගැළපෙන විරුද්ධාර්ථ පදයක්** බැගින් ඉදිරියේ ඇති **තිත් ඉරි මත ලියන්න.**

I. දිරන ............................ II. ලස්සන ................................

7. පහත සඳහන් වාක්‍යයන්හි **වැරදි අක්ෂර සහිත වචන 2ක්** ඇත. එම වචන දෙක තෝරා නිවැරදි කර **එම වචන දෙක පමණක්** තිත් ඉරිමත ලියන්න.

ශ්‍රී ලංකාවේ කසල අර්බුදයට තිරසර විසදුමක් මේ වන විට අවශ්‍ය වී ඇත.

I. ................................ II. ................................

8. එක් එක් වාක්‍යවල අදහසට ගැළපෙන ඉගි වැකිය වරහන් තුළින් තෝරා දී ඇති **හිස්තැන මත ලියන්න**
( ඉහේ මලක් පිපුණා, අහසේ මාළිගා, එක් හුස්මට, අකුරක් නෑර, අබමල් රේණුවක්)

I. ඉතා ස්වල්පයක්වත් ..........................................................................................................

II. කිසිවක් අත නොහැර කියවීම සහ කථා කිරීම ..........................................................................


9. සුදුසු විරාම ලකුණු **යොදන්න.**

දුවේ අපි අපේ වත්තෙ ලස්සන මල් වවමු අම්මා කිවුවා ය

10. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි අකුරෙන් ලියන්න**

I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|



II.

| | | | | | |
|---|---|---|---|---|---|



11. පහත දී ඇති වචන **නිවැරදිව ගළපා අර්ථවත් වැකියක්** බැගින් ලියන්න.

you / like / ice / Do / cream

……………………………………………………………………………………

a / has / month / small / It

……………………………………………………………………………………

12. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

I. Frock ……………..........…… I. Mist …………………

13. ''**නායි**'' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල වචනය** ලියන්න.


.......................................................................................................................................

14. පහත සඳහන් වැකිය **දෙමළෙන් කියන ආකාරයට සිංහලෙන්** ලියන්න.

ඔයාගෙ පැන්සල මෙතන තියෙනවා

....................................................................................................................................

15. පහත ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාවට දෙකක් එකතු කළ පසු සංඛ්‍යාව ලියන්න ..........................




16. | 8 0 5 3 | කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ල යොදාගෙන සියය ස්ථානයේ නිරූපිත අගය 0 වන සහ 5 ඉලක්කමෙන් නිරූපිත අගය 5000ක් වන සංඛ්‍යාවක් ලියන්න ..........................

17. පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැන් දෙකකට ගැළපෙන සංඛ්‍යා දෙක ලියන්න.

31, 25, 19, 13, ........... , ............

18. 38017 සංඛ්‍යාංකයේ සංඛ්‍යානාමය අකුරෙන් ලියන්න

.......................................................................................................................

19. මල්පැළ තවානක රෝස පැළ 4230 ද පිච්ච පැළ 3871 ද තිබුණි. එහි තිබූ මුළු පැළ සංඛ්‍යාව කීයද?

............................

20. එකිනෙක සමාන ත්‍රිකෝණ හැඩ 4ක් සහ දාර 6ක් සහිත ඝන වස්තුවේ ශීර්ෂ ගණන කීයද?

..........................

21. ගොඩක තිබූ පොල්ගෙඩි සංඛ්‍යාවෙන් 1/4 (හතරෙන් පංගු එකක්) ක් ගෙඩි 6කි. ගොඩේ තිබුණු පොල් ගෙඩි ගණන කියද?......................................

22. දැන් වේලාව ප.ව 4.30යි. තව පැය 1 මිනිත්තු 10කට පසු වේලාව සම්මත ක්‍රමයට ලියන්න


..................................

23. මගියෙකු 30km 800m දුරකින් 10km 950m දුරක් බස් රථයකින් ගමන් කරන ලදී. ඉතුරු දුර ප්‍රමාණය කොපමණද ? ..............km....................m

24. තේ කොළ පෙට්ටියකින් 5kg 300g විකිණු පසු 3kg 400g ක ප්‍රමාණයක් ඉතිරි විය. විකිණීමට පෙර තිබූ තේ කොළ ප්‍රමාණය කොපමණද? ..............kg..................g

25. කොමඩු ගෙඩි 615ක් සමාන ව කඩවල් 6ට බෙදා දෙන ලදී. එක් කඩයකට ලැබුණු කොමඩු ගෙඩි ගණන කීයද? ......................................................................

26. තමරා පැන්සලේ දිග මැනීම සඳහා පහත රූපයේ දැක්වෙන ලෙස සෙන්ටිමීටර කෝදුවක් යොදා ගත්තා ය. පැන්සලෙහි දිග කොපමණ ද? සෙන්ටිමීටර ..............................




27. පහත බිල්පත සම්පූර්ණ කරන්න

| ද්‍රව්‍ය | 1kgක මිල<br>රුː සත | මිලටගත්<br>ප්‍රමාණය | මුදල<br>රුː සත |
|---|---|---|---|
| තේ කොළ | 900.00 | 200g | .................... |
| අර්තාපල් | 250.00 | ................... | 125 . 00 |
| මුළු මුදල | | | 305.00 |

28. ජලය 2l 500ml අල්ලන භාජනයකින් දෙවරක් ජලය දමා හිස් භාජනයක් පුරවන ලදි. දැන් භාජනයේ ඇති මුළු ප්‍රමාණය කොපමණ ද ? ...........................................................

29. කාර්යාලයකට සේවකයන් පැමිණෙන ආකාරය පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.




I. බස් රථවලින් හා කාර්වලින් පැමිණෙන සංඛ්‍යාව අතර **වෙනස** කීයද ? .......................

II. යතුරු පැදිවලින් පැමිණෙන සංඛ්‍යාව කාර්වලින් පැමිණෙන සංඛ්‍යාවේ අර්ධයකි.එම සංඛ්‍යාව **ප්‍රස්තාරයේ අඳුරු** කරන්න.

**අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. යම් ආයතනයකින් සේවාවක් ලබාගත් පසු අප ඔවුනට,

I. කෘතඥ විය යුතුය.

II. ත්‍යාග ලබා දිය යුතුය

III. පැවරී ඇති වගකීමක් බව සිහිපත් කළ යුතුය

31. සතුන්ගෙන් මිනිසාට සහ මිනිසාගෙන් සතුන්ට ලැබෙන දේවල් සම්බන්ධ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

I. මිනිසාගෙන් සතුන්ට ලැබෙන ප්‍රයෝජන ප්‍රමාණය වැඩිය.

II. සතුන්ගෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන වැඩිය.

III. මේ දෙපාර්ශවයට සමාන ප්‍රයෝජන ප්‍රමාණ ලැබේ

32. බසයක ගමන් ගන්නා විට වෙන්කළ ආසන හිමි කණ්ඩායමක් නොවේ.

I. පාසල් සිසු සිසුවියන්

II. පූජ්‍ය පක්ෂය

III. ගැබිණි මාතාවන්

33. ප්‍රථමාධාර සම්බන්ධයෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට සහාය ලබා ගත හැකි ආයතනයක් වන්නේ,


1. මහ නගර සභාව 2. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 3. රතු කුරුස සේවය

34. ඌව වෙල්ලස්ස කැරැල්ලේදී සිරභාරයට ගෙන ඉංග්‍රීසි ජාතිකයන් විසින් මරණ දඬුවම් ලබාදෙන මොහොතේ තම හිස එක් කඩු පහරින් වෙන් කරන ලෙස ප්‍රකාශ කළ නිර්භය ජාතික වීරයා වන්නේ,

1. ගොන්ගාලේ ගොඩ බණ්ඩා ය 2. මොනරවිල කැප්පෙටිපොල දිසාව ය

3. පුරන් අප්පු ය.

35.




A B

මෙම රූප සටහන අනුව,

i. A අවස්ථාවේ වැඩියෙන් පස සෝදා යයි


ii. B අවස්ථාවේ වැඩියෙන් පස සෝදා යයි

iii. අවස්ථා දෙකේදී ම වැඩියෙන් පස සෝදා යයි

36. අපට ආවේණික අපේ උරුමයක් ලෙස ගත නොහැකි දෙයක් වන්නේ,

1. ගල් කැටයම් 2.සරුංගලය 3. පෙරහැර

37. පහත රූප ප්‍රකාශනයෙන් කියවෙන්නේ.



1. කුණු දැමීම තහනම්

2. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග මෙයට දමන්න

3. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග පරිසරයට බැහැර නොකරන්න.

38. දණ්ඩ චුම්බකයක් සමබර වන සේ හරි මැදින් එල්ලා නිශ්චල වන ලෙස තැබූ විට එහි,

1. N අග්‍රය උතුරු දිශාවට පිහිටයි. 2. S අග්‍රය උතුරු දිශාවට පිහිටයි. 3. N අග්‍රය දකුණු දිශාවට පිහිටයි.

39. දෙදෙනෙකුට පමණක් කළ හැකි ජන ක්‍රීඩාවකි

1. පංච දැමීම 2. ඔළිඳ කෙළිය 3. මේවර කෙළිය

40. අපට කල හැකි ධනාත්මක වෙනස් වීමක් නොවේ.

1. කුණු කසල නිසි පරිදි බැහැර කිරීම ඇරඹීම.

2. නිදාගත් ස්ථානයෙන් නැගිටින විට එම ස්ථානය පිළිවෙළකට සකස් කිරීම.

3. ආහාර ගැනීමෙන් පසු එම ස්ථානය නිසි පරිදි පිරිසිදු නොකිරීම

41. සතුන්ගෙන් ශාකවලට සිදුවන අයහපතකි.




1. සත්ව මල මුත්‍ර ශාකවලට පොහොර ලෙස ලැබීම 2. මල් පරාගනය සිදු වීම

3. ශාක කොටස් කා දැමීම

42. බතලවල බහුලව ම ඇති පෝෂ්‍ය පදාර්ථය වන්නේ.

1. ප්‍රෝටීන් 2. විටමින් 3. කාබෝහයිඩ්‍රේට්

43. අව අටවක පොහොය දිනට සති 2 ට පසු අහසේ දක්නට ලැබෙන සඳේ හැඩය වන්නේ

1 
2 
3 

44. කමත් බසින් ''බැත'' ලෙසින් හඳුන්වන්නේ

1. බත් 2. වී 3. ගොයම්

45.



මෙම මාර්ග සංඥාව දක්නට ලැබෙන ස්ථානයකි.

1. පන්සල 2. පල්ලිය 3. උසාවිය

46. කෘෂි කර්මාන්තයේ දී ''කිරි වදිනවා'' යනුවෙන් භාවිත වන්නේ.

1. කිරි නිෂ්පාදනය කිරීම 2. පැටවුන් කිරි උරා බීම 3. බෝගවල මල් පිපී පීදීම


47. ශ්‍රී ලංකාවට වැඩියෙන්ම වර්ෂාව ලැබෙන මාස සඳහන් පිළිතුර කුමක්ද?

1. ජූනි,ජූලි 2.ජනවාරි,පෙබරවාරි 3.අගෝස්තු,ඔක්තොබර්

48. පාසල් සිසුන්ගේ ශරීර වර්ධනය නිසිලෙස සිදු වී ඇත්දැයි පරීක්ෂා කරගැනීමට නම්.


1. තම වයසට අදාල බර පරීක්‍ෂා කළ යුතුයි.
2. තම වයසට අදාල උස සහ බර පරීක්‍ෂා කළ යුතුයි.
3. තම බර තවත් සිසුවෙකුගේ බර සමග සංසන්දනය කළ යුතුය

49. පහත ස්විචයේ ඇමුණුම් කටුව වෙනුවට භාවිතා කළ හැකි ද්‍රව්‍ය කුමක්ද?



1. කාඩ්බෝඩ් කැබැල්ලක්
2. ඊයම් සහිත කඩදාසියක්
3. පෑන් බටයක්

50. පහත රූප සටහන අනුව දී ඇති ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශයක් විය හැකි කුමක්ද?




1. A රූපයේ වීදුරුවේ ලුණු මිශ්‍ර ජලය ඇත.
2. B රූපයේ වීදුරුවේ ලුණු මිශ්‍ර ජලය ඇත.
3. A රූපයේ වීදුරුවේ බිත්තරය නරක් වී ඇත.

51. අපේ අතීත මුතුන් මිත්තන් කළ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි

1. ආරුක්කු නවයේ දුම්රිය පාලම 2. මනම්පිටිය පාලම 3. අනුරාධපුර ගල් පාලම

52. වී වගාව සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අතීතයේ භාවිත කළ ක්‍රමයක් නොවේ.

1. සුළං ටකය 2. දිය හොල්මන 3. චුම්භක සමනලයා

53. දිනපතා ප්‍රමාණවත් ලෙස ජලය පානය කිරීමෙන්

1. අධික තරබාරුව අඩුවේ.
2. ශරීරය නිසි පරිදි වර්ධනය වේ.
3. සම ඉරිතැලීම සිදු වේ.

54. විද්‍යුත් තැපැල් ලිපිනයක ඇතුලත් විශේෂ සංකේතය කුමක් ද?

1. #                2. @                3.&

55. කෝලම් රටා සහ කැරොල් ගී ආගමික උත්සව සඳහා භාවිත කරන ජනවර්ග වන්නේ,

1. කතෝලික, හින්දු          2. හින්දු,ඉස්ලාම්          3. හින්දු, කතෝලික

56. උතුරු දුම්රිය මාර්ගයේ හමුවන ප්‍රධාන දුම්රිය මං සන්ධියකි,

1. පේරාදෙණිය          2. ගල් ඔය          3. මැදවච්චිය

57. අතීතයේ කමතේ දී වී මැනිමට යොදාගත් උපකරණය මින් කුමක්ද ?

1. කුරුණිය          2. සේරුව          3. කුල්ල

57. වර්තමානයේ ඉතා ජනප්‍රිය පණිවිඩ හුවමාරු ක්‍රමය වන්නේ,

1. පුවත්පත්          2. සමාජ මාධ්‍ය          3.රූපවාහිනිය

58. ශ්‍රී ලංකාවේ අධිවේගී  මාර්ග නම් කරන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

1. A          2. B          3. E

59 අපේ රටේ ඇති ගල් අඟුරු බලාගාරය පිහිටා ඇත්තේ,

1 කැලණිය          2 ලක්ෂපාන          3 නොරොච්චෝලෙ

60. දිනක් මා පාසල අවසාන වී නිවෙසට ගමන් කරමින් සිටියෙමි.අහස අඳුරු වෙමින් වැහි බිඳු එකින් එක වැටෙන්නට පටන් ගත්තේ ය. පොද වැස්ස ක්‍රමයෙන් මහ වැස්සක් බවට පත් විය. මම අසල නිවසක් වෙත දිව ගියෙමි. ඉන් පසු මා කළ දේ පිළිබඳ නිර්මාණාත්මක වාක්‍ය 3ක් ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත අඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1.................................................................................................................................................

.................................................................................................................................................

2.................................................................................................................................................

.................................................................................................................................................

3.................................................................................................................................................

.................................................................................................................................................

සම්පාදනය :- එම්.එල්.අරුණ ප්‍රියංකර - කු/සියඹලංගමුව ප්‍රාථමික විද්‍යාලය - 076 3 100 710

# "නැණ සිළු 2024"

## පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන විභාගය

## කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

**කට්ටල අංක - 8**

i පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **1** | 1 | **11** | 2 | **21** | 2 | **31** | 1 |
| **2** | 2 | **12** | 3 | **22** | 1 | **32** | 3 |
| **3** | 2 | **13** | 1 | **23** | 3 | **33** | 1 |
| **4** | 1 | **14** | 1 | **24** | 2 | **34** | 3 |
| **5** | 3 | **15** | 1 | **25** | 2 | **35** | 2 |
| **6** | 2 | **16** | 3 | **26** | 2 | **36** | 2 |
| **7** | 3 | **17** | 2 | **27** | 3 | **37** | 1 |
| **8** | 3 | **18** | 3 | **28** | 2 | **38** | 2 |
| **9** | 2 | **19** | 2 | **29** | 2 | **39** | 3 |
| **10** | 2 | **20** | 2 | **30** | 1 | **40** | 3 |

අංක 27 ප්‍රශ්නයට පසු අංකයක් නොමැති ප්‍රශ්නය අංක 39 ප්‍රශ්නය ලෙස සලකන්න.

ii පිළිතුරු

1. i. ගෙයි අසල අගලේ හෝ පොකුණේ
   ii.නැවතීමක් නැතිව කෙරෙන සෝෂණයක්
   iii.මැඩියන්
   iv. සහිත v.වැඩී
   vi.වර්ෂා , පැමිණෙති..........

2. i. ×
   ii. √
   iii. ×
   iv. √
   v. √

3. ගියහ
4. i.ගොවිපොළ

සම්පාදනය :- එම්.එල්.අරුණ ප්‍රියංකර - කු/සියඹලංගමුව ප්‍රාථමික විද්‍යාලය - 076 3 100 710

ii. කැලණි
iii.උච්චාරණය

5. ඔහු තරගයට නිර්මාණ ඉදිරිපත් කරයි

6. i.නොදිරන ii.අවලස්සන
7. i. කසළ ii. විසඳුමක්

8. i. අඹමල් රේණුවක් ii. අකුරක් නැර

9. " දුවේ, අපි අපේ වත්තෙ ලස්සන මල් වවමු." අම්මා කිව්වා ය.

10. i. Elephant – elephant ii. Church – church
11. i. Do you like ice cream
ii. It has a small **mouth**
12. i.ගවුම ii. මීදුම

13.බල්ලා
14. ඔයාගෙ පැන්සල මෙතන තියෙනවා

15. 5305
16. 5083
17. 7,1
18. තිස්අටදහස් දහ හත
19. 8101
20. 4
21.24
22. 17:40
23. 19km 850m
24. 8kg700g
25. 102
26. 4
27. i. 180.00. ii.500g
28. 5$l$
29. i.30 ii. 20 ක් අඳුරු කර තිබිය යුතුයි

30.කෘතඥ විය යුතුය
31.සතුන්ගෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන වැඩිය
32.පාසල් සිසු සිසුවියන්
33.රතු කුරුස සේවය
34.මොණරවිල කැප්පෙටිපොළ දිසාවය
35.A අවස්ථාවේ වැඩියෙන් පස සෝදා යයි
36.සරුංගලය
37 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග පරිසරයට බැහැර නොකරන්න
38.Nඅග්‍රය උතුරු දිශාවට පිහිටයි.
39.ඔලිඳ කෙළිය
40.ආහාර ගැනීමෙන් පසු එම ස්ථානය නිසි පරිදි පිරිසිදු නොකිරීම

41ශාක කොටස් කා දැමීම
42.කාබෝහයිඩ්‍රේට්
43.3
44.වී
45.උසාවිය අසල
46.බෝගවල මල් පිපී පීදීම
47.ජුනි ජූලි
48.තම වයසට අදාළ උස සහ බර පරීක්ෂා කළ යුතුයි
49.ඊයම් සහිත කඩදාසියක්
50. A රූපයේ වීදුරුවේ ලුණු මිශ්‍ර ජලය ඇත
51. අනුරාධපුර ගල් පාලම
52.චුම්භක සමනලයා
53.අධික තරබාරුව අඩුවේ
54. @
55.හින්දු කතෝලික
56.මැදවච්චිය
57.කුරුණෑය
58.සමාජ මාධ්‍ය
59.E
60. වැකියට ලකුණු දෙක බැගින් ලකුණු හයයි.

| | |
|---|---|
| 1 - 14 = 1 x31 | 31 |
| 15 - 28 = 2 x14 | 28 |
| 29 ( i = 1 , ii = 2) | 3 |
| 30 - 59 | 30 |
| 60 | 6 |
| පිරිසිදු බව හා පිළිවෙළට | 2 |

100